ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டுத் தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

**<u>මෙහෙයුම් උපදෙස් අංක : 35/01/005/0007/16</u>**

2020 අප්‍රේල් 17

**සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,**

**සංචිත අවශ්‍යතා : අවම දෛනික තැන්පතු**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් නීති පනත (ලංකා නීති ප්‍රඥප්තියේ 422 වන අධිකාරිය) සංශෝධිත පරිදි 10(ඇ), 93, 94, 96 සහ 97 වැනි වගන්ති යටතේ සහ 2013 අප්‍රේල් 12 වැනි දින අංක 1805/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද (ඇ) නිවේදනයේ සඳහන් වන පරිදි සියලුම වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගැනීමට අවශ්‍ය අවම තැන්පතු සම්බන්ධයෙන් වන සංශෝධිත නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. ඉහත (ඇ) රෙගුලාසි අංක 06 රෙගුලාසියෙහි සඳහන් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් තිරණය කර ඇති පරිදි ඕනෑම දිනක දී වාණිජ බැංකුවක් විසින් පවත්වා ගත යුතු අවම තැන්පතු ප්‍රමාණය සංචිත අවශ්‍යතාවයෙන් සියයට විස්සක් (20%) වේ.

3. ඉහත සඳහන් සංශෝධනය 2020 අප්‍රේල් 16 දිනෙන් ආරම්භ වූ සංචිත කාල පරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වේ. 2013 අප්‍රේල් 22 වැනි දින අංක 35/01/005/0007/06 දරන මෙහෙයුම් උපදෙස්වල අන්තර්ගත අනෙකුත් උපදේශන තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

**අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු**

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව
தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை
Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka
+94 112 477036 +94 112 346287 ddod@cbsl.lk www.cbsl.gov.lk